02112

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන
අවසාන පරීක්ෂණය - 2024/2025
**STP8403/STP8303/ESP2103- අධ්‍යාපනයේ මිනුම සහ ඇගයීම**
කාලය - පැය තුනයි (03)

---

දිනය - 2025.05.03 | වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.
මූලික ගණනය කිරීම් සඳහා සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.

## I වන කොටස

1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අධ්‍යාපනික ඇගයීම් ක්‍රමවේද යොදාගැනීමෙන් ගුරුවරයෙකුට අත්කර ගත හැකි වාසි හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

2. නිදසුන් දක්වමින් "කේන්ද්‍රික ප්‍රවණතා මිනුම්" යනු මොනවා දැයි පැහැදිළි කරන්න.

3. "සැසඳුම් ලැයිස්තුවක්" යනු කුමක්දැයි නිදසුන් ඇසුරින් පැහැදිළි කරන්න.

4. ප්‍රමත සම්භාවිතා වක්‍රයෙහි ගති ලක්ෂණ පහක් (05) ලැයිස්තු ගත කරන්න.

5. i. "සුවිශේෂණ වගුවක්" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිළි කරන්න.

   ii. පරීක්ෂණ සකස්කිරීමේදී සුවිශේෂණ වගුවක් භාවිත කිරීමේ වාසි දෙකක් (02) දක්වන්න.

6. මනෝචාලක සංවර්ධනය කෙරෙහි බලපාන සාධක තුනක් (03) කෙටියෙන් පැහැදිළි කරන්න.

7. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඇගයීමට සාපේක්ෂව තක්සේරුකරණය වඩාත් වැදගත් ඇයිදැයි නිදසුන් දක්වමින් කෙටියෙන් පැහැදිළි කරන්න.

8. i. "අනාවරණ පරීක්ෂණයක්" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිළි කරන්න.

   ii. ඔබගේ විෂය ක්ෂේත්‍රයට අදාලව නිදසුනක් දක්වමින් අනාවරණ පරීක්ෂණ උපකරණයක් නිර්මාණය කරන්නේ කෙසේදැයි යන්න පැහැදිළි කරන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)



27

## II වන කොටස

9. i. "තාක්ෂණය පදනම් කර ගත් තක්සේරුකරණය" (Technology-Based Assessment) යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ ද්විතියික පන්තිකාමරය තුල තාක්ෂණය පදනම් කර ගත් තක්සේරුකරණය ක්‍රියාත්මක කිරීමේදී මුහුණදෙන වාසි දෙකක් (02) සහ අභියෝග දෙකක් (02) දක්වන්න. (ලකුණු 04)

iii. ඉහත (ii) හි දක්වා ඇති, තාක්ෂණය පදනම් කර ගත් තක්සේරුකරණයට අදාළ අභියෝග මගහරවාගැනීම සඳහා විකල්ප ක්‍රමෝපායයන් යෝජනා කරන්න. (ලකුණු 04)

iv. තාක්ෂණය පදනම් කර ගත් තක්සේරුකරණයේදී යොදා ගන්නා උපකරණ තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

v. ඔබ කැමති ඕනෑම විෂය අන්තර්ගතයකට අදාළව සුදුසු උදාහරණයක් දක්වමින්, ඉහත දැක්වූ ඕනෑම උපකරණයක් යොදාගනිමින් ද්විතියික අවධියේ සිසුන්ගේ ඉහළ චින්තන හැකියා තක්සේරු කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

10. i. අ. "සාධන පරීක්ෂණයක්" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ. පන්ති කාමර භාවිතයේදී සාධන පරීක්ෂණවල ප්‍රයෝජනවත් බව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 02)

ii. අ. "රචනා වර්ගයේ" පරීක්ෂණයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

ආ. වාස්තවික වර්ගයේ පරීක්ෂණවල වාසි තුනක් (03) සහ අවාසි තුනක් (03) ලියන්න. (ලකුණු 06)

ඇ. එම එක් එක් අවාසිය මගහරවා ගැනීමට සුදුසු ක්‍රමෝපායයන් යෝජනා කරන්න. (ලකුණු 03)

iii. අ. රචනාවර්ගයේ පරීක්ෂණ වනුවක් ලියා එය ව්‍යුහගත පරීක්ෂණ වනුවකට පරිවර්තනය කරන්න. (ලකුණු 03)

ආ. එම පරිවර්තනයේ වාසි දෙකක් (02) ලියන්න. (ලකුණු02)



28

11. අ. i. "ආවේදනික සංවර්ධනය" යනුවෙන් කුමක් අදහස්වේදැයි විස්තර කරන්න. (ලකුණු 02)

ii. ආවේදනික සංවර්ධනය මැනීමට අපහසු ඇයිදැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ආවේදනික සංවර්ධනය ඇගයීමේ වැදගත්කම නිදසුන් දෙකක්වත් සපයමින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 04)

ආ i. "ආකල්ප" සහ "අභිරුචි" අතර වෙනස සාකච්ඡා කරන්න. (ලකුණු 02)

ii. "ආකල්පවල" ගති ලක්ෂණ හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. ආකල්ප මැනීමට යොදා ගන්නා ශිල්ප ක්‍රම දෙකක් **(02)** නම් කර ඉන් එකක් නිදසුන් සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

## III වන කොටස

12. අ. සංඛ්‍යාත ව්‍යාප්තියක ප්‍රස්තාරික නිරූපණයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ. පන්තියක සිසුන් 40 දෙනෙකු වසර අවසාන පරීක්ෂණයකදී ලබා ගත් ලකුණු පහත දැක්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 21 | 43 | 66 | 69 | 37 | 16 | 55 | 72 |
| 65 | 41 | 53 | 83 | 53 | 58 | 10 | 33 |
| 54 | 25 | 40 | 75 | 45 | 30 | 35 | 66 |
| 75 | 65 | 51 | 28 | 50 | 66 | 89 | 51 |
| 90 | 47 | 55 | 40 | 62 | 26 | 60 | 70 |

i. (44-55) එක් පන්ති ප්‍රාන්තරයක් ලෙස සලකමින් ඉහත ලකුණු සමූහය සඳහා සංඛ්‍යාත ව්‍යාප්තියක් පිළියෙල කරන්න. (ලකුණු 02)

ii. සංඛ්‍යාත ව්‍යාප්තිය සඳහා සමුච්චිත සංඛ්‍යාත වක්‍රය අඳින්න. (ලකුණු 03)

iii. ලකුණු සමූහයේ මාතය සහ මධ්‍යස්ථය ගණනය කරන්න. (ලකුණු 03)

iv. ලකුණු සමූහයේ උපකල්පිත මධ්‍යයනය (44-55) පන්ති ප්‍රාන්තරයේ ඇතැයි සලකමින්, එහි සමාන්තර මධ්‍යයනය ගණනය කරන්න. (ලකුණු 05)

v. ලකුණු සමූහයේ සම්මත අපගමනය ගණනය කරන්න. (ලකුණු 05)



20

13. අ. i. "සහසම්බන්ධතාව" සහ "සහසම්බන්ධතා සංගුණකය" යන පද පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. "පූර්ණ ධන සහසම්බන්ධතාව" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 02)

ආ. වසර අවසාන පරීක්ෂණයකදී සිසුන් 10 දෙනෙකු පළමු බස සහ ඉංග්‍රීසි බස සඳහා ලබා ගත් ලකුණු පහත දැක්වේ.

| සිසුවා / විෂයය | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පළමු බස | 67 | 64 | 57 | 69 | 73 | 62 | 65 | 59 | 68 | 66 |
| ඉංග්‍රීසි බස | 63 | 60 | 52 | 61 | 63 | 55 | 50 | 55 | 56 | 75 |

i. ඉහත ලකුණු සඳහා පියර්සන්ගේ ගුණිත ඝූර්ණ සහසම්බන්ධතා සංගුණකය ගණනය කරන්න. (ලකුණු 12)

ii. සහසම්බන්ධතා සංගුණකය සඳහා ලැබුණු අගය අර්ථකතනය කරන්න. (ලකුණු 02)

14. සිසුන් 3500 ක් පෙනී සිටි පරීක්ෂණයක ලකුණු ප්‍රමත සම්භාවිතා වක්‍රයක ආකාරයට ව්‍යාප්තව ඇත.ව්‍යාප්තියේ සමාන්තර මධ්‍යයනය සහ සම්මත අපගමනය පිළිවෙලින් 50 සහ 15 වේ.

i. ලකුණු 35 සහ 65 අතර ලබාගත් සිසු සංඛ්‍යාව කොපමණද? (ලකුණු 05)

ii. ලකුණු 60 සහ 70 අතර ලබාගත් සිසු සංඛ්‍යාව කොපමණද? (ලකුණු 05)

iii. හොඳම සිසුන් 05% ට A ශ්‍රේණි ලබාදීමට අපේක්ෂා කරන්නේ නම්, A ශ්‍රේණියක් ලබා ගැනීමට අවශ්‍ය අවම ලකුණ කොපමණද? (ලකුණු 05)

iv. සිසුන්ගෙන් 65% ක් විභාගය සමත් කිරීමට, විභාගය සමත් කිරීමේ අවම ලකුණ ගණනය කරන්න. (ලකුණු 05)

-සියලුම හිමිකම් ඇවිරිණි.-



30

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
இலங்கை திறந்த பல்கலைக்கழகம்
The open university of Sri Lanka

සම්මත ප්‍රමිත වක්‍රය යට ක්ෂේත්‍රඵල - (0 සිට Z දක්වා)
நியம வளையியி இன் பரப்பளவுகள் - 0 முதல் Z வரை
Areas Under the Standard Normal Curve – from 0 to z




| Z | 0.00 | 0.01 | 0.02 | 0.03 | 0.04 | 0.05 | 0.06 | 0.07 | 0.08 | 0.09 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0.0 | 0.0000 | 0.0040 | 0.0080 | 0.0120 | 0.0160 | 0.0199 | 0.0239 | 0.0279 | 0.0319 | 0.0359 |
| 0.1 | 0.0398 | 0.0438 | 0.0478 | 0.0517 | 0.0557 | 0.0596 | 0.0636 | 0.0675 | 0.0714 | 0.0753 |
| 0.2 | 0.0793 | 0.0832 | 0.0871 | 0.0910 | 0.0948 | 0.0987 | 0.1026 | 0.1064 | 0.1103 | 0.1141 |
| 0.3 | 0.1179 | 0.1217 | 0.1255 | 0.1293 | 0.1331 | 0.1368 | 0.1406 | 0.1443 | 0.1480 | 0.1517 |
| 0.4 | 0.1554 | 0.1591 | 0.1628 | 0.1664 | 0.1700 | 0.1736 | 0.1772 | 0.1808 | 0.1844 | 0.1879 |
| 0.5 | 0.1915 | 0.1950 | 0.1985 | 0.2019 | 0.2054 | 0.2088 | 0.2123 | 0.2157 | 0.2190 | 0.2224 |
| 0.6 | 0.2257 | 0.2291 | 0.2324 | 0.2357 | 0.2389 | 0.2422 | 0.2454 | 0.2486 | 0.2517 | 0.2549 |
| 0.7 | 0.2580 | 0.2611 | 0.2642 | 0.2673 | 0.2704 | 0.2734 | 0.2764 | 0.2794 | 0.2823 | 0.2852 |
| 0.8 | 0.2881 | 0.2910 | 0.2939 | 0.2967 | 0.2995 | 0.3023 | 0.3051 | 0.3078 | 0.3106 | 0.3133 |
| 0.9 | 0.3159 | 0.3186 | 0.3212 | 0.3238 | 0.3264 | 0.3289 | 0.3315 | 0.3340 | 0.3365 | 0.3389 |
| 1.0 | 0.3413 | 0.3438 | 0.3461 | 0.3485 | 0.3508 | 0.3531 | 0.3554 | 0.3577 | 0.3599 | 0.3621 |
| 1.1 | 0.3643 | 0.3665 | 0.3686 | 0.3708 | 0.3729 | 0.3749 | 0.3770 | 0.3790 | 0.3810 | 0.3830 |
| 1.2 | 0.3849 | 0.3869 | 0.3888 | 0.3907 | 0.3925 | 0.3944 | 0.3962 | 0.3980 | 0.3997 | 0.4015 |
| 1.3 | 0.4032 | 0.4049 | 0.4066 | 0.4082 | 0.4099 | 0.4115 | 0.4131 | 0.4147 | 0.4162 | 0.4177 |
| 1.4 | 0.4192 | 0.4207 | 0.4222 | 0.4236 | 0.4251 | 0.4265 | 0.4279 | 0.4292 | 0.4306 | 0.4319 |
| 1.5 | 0.4332 | 0.4345 | 0.4357 | 0.4370 | 0.4382 | 0.4394 | 0.4406 | 0.4418 | 0.4429 | 0.4441 |
| 1.6 | 0.4452 | 0.4463 | 0.4474 | 0.4484 | 0.4495 | 0.4505 | 0.4515 | 0.4525 | 0.4535 | 0.4545 |
| 1.7 | 0.4554 | 0.4564 | 0.4573 | 0.4582 | 0.4591 | 0.4599 | 0.4608 | 0.4616 | 0.4625 | 0.4633 |
| 1.8 | 0.4641 | 0.4649 | 0.4656 | 0.4664 | 0.4671 | 0.4678 | 0.4686 | 0.4693 | 0.4699 | 0.4706 |
| 1.9 | 0.4713 | 0.4719 | 0.4726 | 0.4732 | 0.4738 | 0.4744 | 0.4750 | 0.4756 | 0.4761 | 0.4767 |
| 2.0 | 0.4772 | 0.4778 | 0.4783 | 0.4788 | 0.4793 | 0.4798 | 0.4803 | 0.4808 | 0.4812 | 0.4817 |
| 2.1 | 0.4821 | 0.4826 | 0.4830 | 0.4834 | 0.4838 | 0.4842 | 0.4846 | 0.4850 | 0.4854 | 0.4857 |
| 2.2 | 0.4861 | 0.4864 | 0.4868 | 0.4871 | 0.4875 | 0.4878 | 0.4881 | 0.4884 | 0.4887 | 0.4890 |
| 2.3 | 0.4893 | 0.4896 | 0.4898 | 0.4901 | 0.4904 | 0.4906 | 0.4909 | 0.4911 | 0.4913 | 0.4916 |
| 2.4 | 0.4918 | 0.4920 | 0.4922 | 0.4925 | 0.4927 | 0.4929 | 0.4931 | 0.4932 | 0.4934 | 0.4936 |
| 2.5 | 0.4938 | 0.4940 | 0.4941 | 0.4943 | 0.4945 | 0.4946 | 0.4948 | 0.4949 | 0.4951 | 0.4952 |
| 2.6 | 0.4953 | 0.4955 | 0.4956 | 0.4957 | 0.4959 | 0.4960 | 0.4961 | 0.4962 | 0.4963 | 0.4964 |
| 2.7 | 0.4965 | 0.4966 | 0.4967 | 0.4968 | 0.4969 | 0.4970 | 0.4971 | 0.4972 | 0.4973 | 0.4974 |
| 2.8 | 0.4974 | 0.4975 | 0.4976 | 0.4977 | 0.4977 | 0.4978 | 0.4979 | 0.4979 | 0.4980 | 0.4981 |
| 2.9 | 0.4981 | 0.4982 | 0.4982 | 0.4983 | 0.4984 | 0.4984 | 0.4985 | 0.4985 | 0.4986 | 0.4986 |
| 3.0 | 0.4987 | 0.4987 | 0.4987 | 0.4988 | 0.4988 | 0.4989 | 0.4989 | 0.4989 | 0.4990 | 0.4990 |
| 3.1 | 0.4990 | 0.4991 | 0.4991 | 0.4991 | 0.4992 | 0.4992 | 0.4992 | 0.4992 | 0.4993 | 0.4993 |
| 3.2 | 0.4993 | 0.4993 | 0.4994 | 0.4994 | 0.4994 | 0.4994 | 0.4994 | 0.4995 | 0.4995 | 0.4995 |
| 3.3 | 0.4995 | 0.4995 | 0.4995 | 0.4996 | 0.4996 | 0.4996 | 0.4996 | 0.4996 | 0.4996 | 0.4997 |
| 3.4 | 0.4997 | 0.4997 | 0.4997 | 0.4997 | 0.4997 | 0.4997 | 0.4997 | 0.4997 | 0.4997 | 0.4998 |
| 3.5 | 0.4998 | 0.4998 | 0.4998 | 0.4998 | 0.4998 | 0.4998 | 0.4998 | 0.4998 | 0.4998 | 0.4998 |
| 3.6 | 0.4998 | 0.4998 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 |
| 3.7 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 |
| 3.8 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 | 0.4999 |
| 3.9 | 0.5000 | 0.5000 | 0.5000 | 0.5000 | 0.5000 | 0.5000 | 0.5000 | 0.5000 | 0.5000 | 0.5000 |

Some important formulas / වැදගත් සූත්‍ර කිහිපයක් / சில முக்கிய சூத்திரங்கள்

$$\rho = \left[1 - \frac{6\sum D^2}{N(N^2-1)}\right]$$

$$A.M_{(\overline{x})} = \left(A + \frac{i\sum fd}{N}\right)$$

$$SD_{(\sigma)} = i\sqrt{\frac{\sum fd^2}{N} - \left(\frac{\sum fd}{N}\right)^2}$$

$$\gamma_{xy} = \frac{\sum XY}{\sqrt{(\sum X^2)(\sum Y^2)}}$$

$$\gamma_{xy} = \frac{\sum(x-\bar{x})(y-\bar{y})}{\sqrt{\sum(x-\bar{x})^2 \times \sum(y-\bar{y})^2}}$$

$$\gamma_{xy} = \frac{n\sum xy - (\sum x)(\sum y)}{\sqrt{[n\sum x^2 - (\sum x)^2][n\sum y^2 - (\sum y)^2]}}$$